www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# ශ්‍රී ලංකාවේ මැතිවරනය: ෆොන්සේකාට මුක්කුව දීම සඳහා ජවිපෙ අධම සන්ධානයක

## Sri Lankan elections: JVP in sordid alliance to back Fonseka

කේ. රත්නායක විසිනි

2010 ජනවාරි 5

ශ්‍රී ලංකාවේ 2010 ජනාධිපතිවරන ව්‍යාපාරයෙන් ජනතා විමුක්ති පෙරමුන (ජවිපෙ) අතිශය පැහැදිලිව එලිදරව් වෙමින් පවතී. වැඩ කරන ජනතාව ද ඉඳහිට "සමාජවාදය" ද ආරක්ෂා කරන බවට තව මත් කතා පවත්වන මෙම සිංහල ජනතාවාදී පක්ෂය, හිටපු හමුදාපති ජනරාල් සරත් ෆොන්සේකාට සහාය දීමෙහි ලා දක්ෂිනාංශික එක්සත් ජාතික පක්ෂය (එජාප) සමග එක්ව සිටී.

ෆොන්සේකා තරග කරන්නේ, වත්මන් ජනාධිපති මහින්ද රාජපක්ෂට එරෙහිව ප්‍රධාන විරුද්ධ පක්ෂ දෙකේ නිර්පාක්ෂික "පොදු අපේක්ෂකයා" වශයෙනි. බෙදුම්වාදී දෙමල ඊලම් විමුක්ති කොටි (එල්ටීටීඊ) සංවිධානයට එරෙහිව තෙවසරක් තිස්සේ කර ගෙන ගොස් මැයි මාසයේ දී එල්ටීටීඊයේ පරාජයෙන් අවසන් වූ විනාශකාරී වාර්ගික යුද්ධයට, ජනාධිපති හැටියට රාජපක්ෂත් රටේ ඉහල ම ජනරාල්වරයා හැටියට ෆොන්සේකාත් එක සේ වගකිව යුතු ය.

ජවිපෙ සහ එජාප යන දෙක ම රාජපක්ෂගේ වංචනික "ත්‍රස්තවාදයට එරෙහි යුද්ධයට" සහාය දුන්නේ ය, ජීවන තත්ත්වයන්ට සහ රැකියාවලට ඔහු එල්ල කල දරුනු ප්‍රහාරවලට විරුද්ධත්වය නොපෑවේ ය. පසු ගිය වසරෙහි පැවැත්වුනු පලාත් සභා මැතිවරන මාලාවේ දී, ආන්ඩුවේ පිලිවෙතට එරෙහිව කිසිදු විකල්පයක් ඉදිරිපත් නොකල මෙම පක්ෂ දෙක බරපතල පරාජයකට පත් විය. මැතිවරන ව්‍යාපාරය එල්ටීටීඊය පරාජය කිරීම පිලිබඳ කරුනට පමනක් සීමා කරන්නට උත්සාහ කරන රාජපක්ෂට වලකැපීමේ මගක් ලෙස සලකා දැන් ඔවුහු "ජයග්‍රාහී ජනරාල්වරයාට" සහාය දෙමින් සිටිති.

රාජපක්ෂගේ පාලනය සම්බන්ධයෙන් ජවිපෙ සෘජු වගකීමක් දරයි. 2005 දී, එජාප අපේක්ෂක රනිල් වික්‍රමසිංහට එරෙහිව එය රාජපක්ෂ වෙනුවෙන් ක්‍රියාකාරීව උද්ඝෝෂනය කලේ ය. රාජපක්ෂගේ ඊනියා "මහින්ද චින්තන" වැඩ පිලිවෙලෙන් වැඩි කොටසක් කෙටුම්පත් කලේ, එවක පැවති එජාප ආන්ඩුව එල්ටීටීඊය සමග පැවැත්වූ සාම කතාවලට සතුරුව සිටිමින් 2002 සටන් විරාම ගිවිසුම යලි කෙටුම්පත් කල යුතු යැයි කෑඳවුම් කල ජවිපෙ ය. සමාජවාදී සමානතා පක්ෂයේ (සසප) අපේක්ෂක විජේ ඩයස් එවක අනතුරු ඇඟවූ පරිදි, එය වනාහි යුද වැඩ පිලිවෙලක් විය.

රාජපක්ෂ ලද පටු ජයග්‍රහනයෙන් පසුව ජවිපෙ විරුද්ධ පක්ෂයෙහි රැඳින, එහෙත් පාර්ලිමේන්තුව තුල සිදු වන ප්‍රධාන ඡන්ද විමසීම්වල දී ආන්ඩුවට සහාය දෙන බවට එය එකඟ විය. 2006 ජූලි මාසයේ දී රාජපක්ෂ යලි සිවිල් යුද්ධය ඇරඹූ පසුව, අත්‍යවශ්‍ය සේවාවන් සහ සහනාධාර සඳහා කරන රජයේ වියදම් දරුනු ලෙස කප්පාදු කල ඔහුගේ දැවැන්ත මිලිටරි අයවැයවලට පක්ෂව ජවිපෙ ඡන්දය දුනි. යුද ප්‍රයත්නයට තර්ජනය කල සියලු කාර්මික ක්‍රියාවන් මර්දනය කිරීමට සිය වෘත්තීය සමිති හරහා ජවිපෙ උදව් කලේ ය. යුද්ධය කෙරෙහි මහජන විරුද්ධත්වය වර්ධනය වෙද්දී සහ වඩාත් නරක අතට හැරෙමින් පැවති ආර්ථික සහ සමාජ අර්බුදය උග්‍ර වෙද්දී, 2008 දී ජවිපෙ අභ්‍යන්තර වශයෙන් භේදභින්න වී ගියේ ය. එහි මන්ත්‍රීවරුන්ගෙන් බොහෝ දෙනෙක්, ජාතික නිදහස් පෙරමුන (ජානිපෙ) ගොඩ නගා ගෙන එලිපිට ම ආන්ඩුවට එක් වූහ.

ජවිපෙ පත්ව සිටින අවුල් සහගත තත්ත්වය, පසු ගිය වසරෙහි පැවැත්වුනු පලාත් සභා මැතිවරනවල දී මැනවින් පැහැදිලි විය. මධ්‍යම පලාතේ දී 12 සිට බිංදුව දක්වා ද වයඹ පලාතේ දී 6 සිට 1 දක්වා ද බස්නාහිර පලාතේ දී 23 සිට 3 දක්වා ද දකුනු පලාතේ දී 14 සිට 3 දක්වා ද එහි ආසන ගනන පහත වැටින. දිලිඳු භාවයට පත් සිංහල ගම්බද තරුනයන්ගෙන් සැදුම් ලද ගරිල්ලා ව්‍යාපාරයක් හැටියට 1960 ගනන්වල දී පිහිටුවූ තැන් පටන් ඊට පවතින සහායේ පදනමක් බවට පත් වී තිබෙන දකුනේ දී ජවිපෙ පරාජයට පත් වීම විශේෂයෙන් ම අර්ථභාරී විය.

වත්මන් මැතිවරනයේ දී, ජවිපෙ ප්‍රජාතන්ත්‍රවාදයේ ආරක්ෂකයෙකු ලෙස පෙනී සිටිමින්, "පවුල්වාදය සහ ආඥාදායකත්වය" සම්බන්ධයෙන් රාජපක්ෂ තන්ත්‍රයට පහර එල්ල කරමින් සිටියි. සන්ඩේ ටයිම්ස් පුවත්පතට ගිය මාසයෙහි දුන් සම්මුඛ සාකච්ඡාවක දී ජවිපෙ නායක සෝමවංශ අමරසිංහ මෙසේ කියා සිටියේ ය: "ඔහු [ජනරාල් ෆොන්සේකා] ශ්‍රී ලංකාව තුල පවතින ආඥාදායක විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කරන්න එකඟ වෙලා තියෙනවා. දෙවනුව, ඔහු ප්‍රජාතන්ත්‍රවාදය යලි පන ගන්වන්න සහ ශක්තිමත් කරන්නත් යහපාලනය ගෙන එන්නත් එකඟ වෙලා තියෙනවා."

යුද්ධය ජය ගැනීමෙන් පසුව ෆොන්සේකා දැන් දිවයිනට ප්‍රජාතන්ත්‍රවාදය ගෙන ඒමේ "දෙවන මෙහෙයුමක" යෙදී සිටිතැයි, සිය උද්ඝෝෂනයට මිලිටරිමය පැහැයක් ගෙන දෙමින් ජවිපෙ කියා සිටියි.

ජවිපෙ සහ ෆොන්සේකා "ප්‍රජාතන්ත්‍රවාදීන්" ලෙස පෙනී සිටීම විකාරයකි. ෆොන්සේකා, රාජපක්ෂ සමග එක් වී ගෙන, යුද්ධයත් ඒ හා බැඳුනු සියලු සාපරාධී ක්‍රියාවනුත්, එනම්, මිලිටරිය විසින් සිවිල් වැසියන් ඝාතනය කරනු ලැබීම සහ එල්ටීටීඊය පරාජයට පත් වීමෙන් පසුව ලක්ෂ ගනන් දෙමල සිවිල් වැසියන් නීති විරෝධී ලෙස සිරගත කිරීම, කර ගෙන ගියේ ය. ජවිපෙ දැන් ආඥාදායක විධික්‍රම සම්බන්ධයෙන් රාජපක්ෂට සහ ඔහුගේ කල්ලියට දෝෂාරෝපනය කරන මුත්, ආරක්ෂක හමුදාවලින් ලද දුෂ්ට සහාය ඇතිව ක්‍රියා කල ඝාතක කල්ලි අතින් දේශපාලනඥයන් සහ මාධ්‍ය සේවකයන් ද ඇතුලු සිය ගනනක් ජනයා ඝාතනය වෙද්දී සහ අතුරුදන් වෙද්දී ජවිපෙ ඒවා එලිපිට ම ආරක්ෂා කලේ ය.

ෆොන්සේකා බලගතු විධායක ජනාධිපති ක්‍රමය අවසන් කරනු ඇති බවට ජවිපෙ කරන කියාපෑම් අතිශය රැවටිලි සහගත ය. විරුද්ධ පක්ෂයේ ලැග සිටින කාලවල දී ජනාධිපති අපේක්ෂකයන් විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කරන බවට වතාවතක් ලෙස කැඳවුම් නිකුත් කරන්නේ, ඔවුන් ජය ගත හොත් ඒ බලතලවලින් පරිපූර්න ප්‍රයෝජනය ගැනීමට පමනකි. මිලිටරිය හැරුනු විට තමන්ගේ ම වූ සැලකිය යුතු වෙනත් සහායක පදනමක් නැති ෆොන්සේකා, මෙම තත්ත්වයෙන් බැහැර වනවා වෙනුවට, ඔහුගේ පූර්වගාමීන්ටත් වැඩිමනත්ව පවා අධික ලෙස පුලුල් ජනාධිපති බලතල මත පාදක වනවා ඇත.

ජනවාරි 26 වන දා පැවැත්වෙන ජනාධිපතිවරනයෙන් රාජපක්ෂ දිනුවත් ෆොන්සේකා දිනුවත් ඊලඟට බලයට පත් වන ආන්ඩුව රජයේ වියදම් ද වැඩ කරන ජනයාගේ ජීවන තත්ත්වයන් ද මතට දැවැන්ත ප්‍රහාරයක් දියත් කරනු ඇත. ජාත්‍යන්තර මූල්‍ය අරමුදල ඉල්ලා සිටින පටි තද කර ගැනීමේ පිලිවෙත් පුලුල්ව පැතිර ගිය විරුද්ධත්වයක් ඉක්මනින්ම අවුලුවාලනු ඇති බව ගැන මුලුමනින් ම දැනුවත්ව ය රාජපක්ෂ වසර දෙකකට කලින් මැතිවරනය කැඳවූයේ. මෙම "දෙවන මෙහෙයුම" කර ගෙන යාමේ දී, මතු වී එන එවන් කවර විරුද්ධත්වයක් වුව මඩිනු පිනිස 26 වසරක සිවිල් යුද්ධය අතරතුර දී ගොඩ නගා ගත් පොලිස්-රාජ්‍ය පිලිවෙත් යොදා ගැනීමේ දී ෆොන්සේකා ද රාජපක්ෂ සේ ම අනුකම්පා විරහිත වනු ඇත.

ඡන්ද දායකයන් උදෙසා වඩා පුලුල් ප්‍රජාතන්ත්‍රවාදයක් ද දියුනු ජීවන තත්ත්වයන් ද ගෙන එන බවට පොරොන්දු දෙන අතරවාරයේ ෆොන්සේකා පාලක ප්‍රභූව වෙත තමන් ඉදිරිපත් කර ගන්නේ, "නීතිය සහ සාමය" බල ගන්වන්නට, දූෂනයට එරෙහිව දැඩි පියවර ගන්නට සහ "විනයගත සමාජයක්" ස්ථාපනය කරන්නට යන බොනපාට්වාදී චරිතයක් ලෙස ය. ජවිපෙ නායක අමරසිංහ සිය සම්මුඛ සාකච්ඡාවේ දී මේ හා සමාන වචනවලින් ෆොන්සේකාට හුරේ දැමී ය. ඔහු මෙසේ පැවසී ය: "ජනරාල් බංකොලොත් දේශපාලනඥයෙක් නෙවෙයි. ඔහු වංචනිකයෙක් නෙවෙයි... ඔහු දූෂිතයෙක් කරන්න බැහැ."

ඔහුගේ "මහින්ද චින්තනය" සූත්‍රගත කරන්නට රාජපක්ෂට උදව් කල සේ ම, ෆොන්සේකාට සහාය වීම සඳහා බොරු පොරොන්දු වැඩ පිලිවෙලක් කෙටුම්පත් කිරීමේ දී දැන් ජවිපෙ එජාප සමග එක් වී සිටී. පසු ගිය සිකුරාදා ජවිපෙ පාර්ලිමේන්තු මන්ත්‍රී අනුර කුමාර දිසානායක නිවේදනය කලේ, ඊලඟ ආන්ඩුව යටතේ ක්‍රියාත්මක වීමට නියමිත "අවම පොදු වැඩ පිලිවෙලකට" විරුද්ධ පක්ෂ දෙක එකඟ වී ඇති බව යි; ගොවීන්ට, රජයේ සහ පෞද්ගලික අංශයේ සේවකයන්ට සහ විශ්‍රාමිකයන්ට "සහන" සැපයීම, දුෂ්ට හදිසි නීති රෙගුලාසි වෙනස් කිරීම සහ දෙමල සිවිල් වැසියන් යලි පදිංචි කිරීම ඊට ඇතුලත් වන බව යි.

මෙම මැතිවරන පොරොන්දුවලින් එකක් වත් රකිනු නැත. ඔවුන්ගේ "අවම පොදු වැඩ පිලිවෙල" සන්ධාන ආන්ඩුවක් උදෙසා වූවක් නො වේ ය යන කරුනෙන්, ජවිපෙ සහ එජාප අතර දිගින් දිගට ම පවතින තියුනු මතභේදවලින් පැහැදිලි වේ. ඔවුන්ගේ සැලැස්මට අනුව, වැඩි ම ආසන ගනනක් දිනා ගන්නා පක්ෂය ආන්ඩුවක් පිහිටුවනු ඇත, අනෙක් පක්ෂය විරුද්ධ පක්ෂයෙහි සිටිමින් තීරනාත්මක ඡන්ද විමසීම්වල දී ආන්ඩුවට සහාය දෙනු ඇත. එහෙත් මෙම සියලු ගනන් බැලීම් රඳා පවතින්නේ ෆොන්සේකා පාර්ලිමේන්තු මැතිවරනය කැඳවීම සහ විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කිරීම මත ය. නමුත් තමන්ට නාම මාත්‍රික ජනාධිපතිවරයෙකු වන්නට කිසිදු අදහසක් නැති බව ජනරාල්වරයා දැනට මත් අඟවා ඇත.

ජවිපෙ කොලඹ දේශපාලන සංස්ථාපිතයේ ආධාරක කුලුනක් බවට පරිවර්තනය වීම දිග්ගැසුනු ක්‍රියා දාමයකි. 1971 දී, ගරිල්ලා කන්ඩායමක් ලෙස ජවිපෙ අසාර්ථක කැරැල්ලක් දියත් කලේ ය. ඉන් අනතුරුව ආන්ඩුව මුදා හල මර්දනයෙන් ගම්බද තරුනයෝ 20,000කට ආසන්න සංඛ්‍යාවක් ඝාතනය වූහ. "මාක්ස්වාදී" වාග් පාඨ හඬ තලන අතරතුරේ ජවිපෙ හැම විට ම පදනම්ව සිටියේ සිංහල ජාත්‍යොත්තමවාදය මත යි. 1983 දී සිවිල් යුද්ධය පුපුරා යාමත් සමග එය වඩාත් පැහැදිලිව පෙනෙන්නට විය.

දෙමල ප්‍රභුවට සීමිත සහන පිදූ බැවින්, පක්ෂය 1987 ඉන්දු-ලංකා ගිවිසුම දැඩි ලෙස හෙලා දුටුවේ ය. ජවිපෙ තුවක්කුකරුවෝ, ගිවිසුමට එරෙහිව තමන් ගෙන ගිය "දේශප්‍රේමී" උද්ඝෝෂනයට එක් වීම ප්‍රතික්ෂේප කල කම්කරුවන් ද දේශපාලන විරුද්ධවාදීන් ද සිය ගනනක් ඝාතනය කලහ. ජවිපෙ ආන්ඩුව තුලට ගැනීමේ අදහස සමග සෙල්ලම් කිරීමෙන් පසුව එය සමග පැවති නිහඬ සන්ධානය අවසන් කොට මිලිටරිය මුදා හල එජාපය, එම ක්‍රියාදාමයේ දී සිංහල තරුනයන් 60,000කට ආසන්න සංඛ්‍යාවක් කෲර ලෙස ඝාතනය කර දැමී ය.

ජනාධිපති චන්ද්‍රිකා කුමාරතුංග සහ ඇයගේ ශ්‍රී ලංකා නිදහස් පක්ෂය (ශ්‍රීලනිප) බලයට පත් වීමෙන් පසුව, 1994 දී ජවිපෙ ප්‍රධාන දේශපාලන ප්‍රවාහයට පිවිසියේ ය. ශ්‍රීලනිපය සහ එජාපය ගැන දේශපාලනික කලකිරීම වර්ධනය වීම මධ්‍යයේ දී, පාලක ප්‍රභූන් උදෙසා වූ දේශපාලනික ආරක්ෂක කපාටයක් ලෙස සේවය කරමින් ජවිපෙ තීරනාත්මක කාර්ය භාරයක් ඉටු කලේ ය. 2004 දී කුමාරතුංගගේ සන්ධානයට එක් වූ ජවිපෙ, පලමු වතාවට ආන්ඩුවේ කොටසක් බවට පත් විය. ප්‍රතිඵලය වූයේ, සංස්ථාපිත පක්ෂ දෙකට විරෝධය පෑමක් ලෙස සලකා ජවිපෙට ඡන්දය දුන්නවුන් ජවිපෙ ඇමතිවරුන් සහ ආන්ඩුවේ සෙසු ඇමතිවරුන් අතර කිසිදු වෙනසක් නැතැයි යන නිගමනයට එලඹීමෙන් ඊට පැවති සහාය වේගයෙන් හීන වී යාම යි.

ජවිපෙ කිසි විටෙකත් එම තත්වයෙන් ගොඩ විත් නැත. තමන්ට පැවති සහාය නැතිව යාම වඩාත් පැහැදිලිව එලිදරව් වෙතැයි බිය ගෙන 2005 මැතිවරනයේ දී තමන්ගේ ම ජනාධිපති අපේක්ෂකයෙකු ඉදිරිපත් නොකල එය, ඒ වෙනුවට රාජපක්ෂට සහාය දුන්නේ ය. රාජපක්ෂ ජවිපෙ ජාත්‍යොත්තමවාදී වැඩ පිලිවෙල සක්‍රිය ආකාරයෙන් තමන් වෙත පවරා ගැනීමෙන් පසුව, පක්ෂයේ සහයෝගී පදනම් දිගින්දිගටම කඩා වැටුනේ. රාජපක්ෂ ආන්ඩුවට එක් වනවා ද නැද්ද යන හුදු උපායාත්මක ගැටලුවක් මත 2008 දී එය තව දුරටත් බෙලහීන කල භේදයකට තුඩු දෙමිනි. මෑතක දී, එහි කාන්තා අංශයේ ජාතික සංවිධායිකා ප්‍රියංගිකා කොතලාවල පක්ෂයෙන් ඉල්ලා අස් වී ආන්ඩුවට එක් වූවා ය.

අත්‍යවශ්‍ය නිගමන උකහා ගන්නා ලෙස සසප කම්කරුවන්ගෙන් සහ තරුනයන්ගෙන් ඉල්ලා සිටී. ජවිපෙ පරිනාමයෙන් අවධාරනය වන්නේ, සකලවිධ ජාතිකවාදයන්ගේ සහ වර්ගවාදයන්ගේ, ඒවායේ වඩාත් ම රැඩිකල් ප්‍රභේදයන්ගේ පවා, දේශපාලනික බංකොලොත්කම යි. සිංහල, දෙමල සහ මුස්ලිම් වැඩ කරන ජනතාවට සිය අතිමූලික අයිතීන් ආරක්ෂා කර ගත හැකි වන්නේ, සමාජවාදී පිලිවෙත් මත පදනම් වූ කම්කරුවන්ගේ සහ ගොවීන්ගේ ආන්ඩුවක් ගොඩ නැගීම සඳහා පාලක පන්තියේ සියලු කන්ඩායම්වලින් ස්වාධීනව එකමුතු වී දේශපාලන අරගලයක් ඉස්මත්තට ගැනීමෙන් පමනකි. මැතිවරනයේ දී සසප අපේක්ෂක විජේ ඩයස් සටන් වදිමින් සිටින්නේ මෙම වැඩ පිලිවෙල උදෙසා ය.

© www.wsws.org